**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| **තෙවන වාර පරීක්ෂණය 2020** | **11 ශ්‍රේණිය** |
| **மூன்றாம் தவணைப் பரீட்சை 2020** | **தரம் 11** |
| **Third Term Test 2020** | **Grade 11** |

| | | |
|---|---|---|
| **බුද්ධ ධර්මය** | **II** | **පැය දෙකයි** |
| **பௌத்த சமயம்** | **II** | **இரண்டு மணித்தியாலம்** |
| **Buddhism** | **II** | ***Two hours*** |

**සැලකිය යුතුයි.**
- **පළමුවැනි** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

01. කෙටි පිළිතුරු සපයන්න.

i. මාර දූවරුන් තිදෙනා නම් කරන්න

ii. පස්වග තවුසන් රහත් භාවයට පත්වූයේ කිනම් සූත්‍ර දේශනාවක් ශ්‍රවණය කිරීමෙන් ද?

iii. ''ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති'' මෙම පාඨයේ අර්ථය ලියන්න.

iv. අමාවතුර හා බුත්සරණ යන ධර්ම ග්‍රන්ථ රචනා කළ කතුවරුන්ගේ නම් ලියන්න.

v. 'භෝග සුඛය' යන්න කෙටියෙන් අර්ථ දක්වන්න.

vi. පත්තකම්ම සූත්‍රයේ සඳහන් පංචබලි අතරින් **දෙකක්** නම් කරන්න.

vii. වට්ටක ජාතකයෙන් ප්‍රකට වන්නේ බෝසතාණන් සම්පූර්ණ කළ කිනම් පාරමිතාව ද?

viii. ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ සඳහන් මෙලොව දියුණුවට හේතුවන කරුණු **දෙකක්** නම් කරන්න.

ix. කර්මය විපාක දෙන කාලය අනුව කොටස් හතරකි. ඉන් **දෙකක්** නම් කරන්න.

x. කලාත්මක ම බෝධිඝරය හා වාහල්කඩ පිහිටි ස්ථාන දෙක පිළිවෙළින් ලියා දක්වන්න.

02. i. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් උතුරු දිශාව හා දකුණු දිශාව උපමාකරනු ලැබූ සමාජ කණ්ඩායම් දෙක නම් කරන්න.

ii. ඉහත දක්වූ එක් සමාජ කණ්ඩායමකින් ඉටුවන යුතුකම් **තුනක්** ලියා දක්වන්න.

iii. ''යුතුකම් හා වගකීම් ඉටුකිරීම මගින් පුද්ගල හා සමාජ සංවර්ධනය ඇතිවේ.'' සිගාලෝවාද සූත්‍රය ඇසුරෙන් විමසන්න.

03. i. ''නතං කම්මං කතං සාධූ'' යන ගාථාව සම්පූර්ණ කරන්න.

ii. එම ගාථාවේ අර්ථය ලියන්න.

iii. ''ධම්ම පදය ශිෂ්‍ය ජීවිතය සංවර්ධනය කර ගැනීම සඳහා උපයෝගී වේ.'' විමසන්න.

04. i. සීලයේ ආනිසංස **දෙකක්** නම් කරන්න.

ii. ඉන් එක් කරුණක් කෙටියෙන් හඳුන්වන්න.

iii. සදාචාර සංවර්ධනය උදෙසා සීලයේ ඇති උපයෝගීතාවය පැහැදිලි කරන්න.

05. i. තෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට හේතු වූ කරුණු **දෙකක්** සඳහන් කරන්න.

ii. මෙම ධර්ම සංගායනාව පැවැත් වූ ස්ථානය, අනුග්‍රහකත්වය හා මූලිකත්වය ගත් රහතන් වහන්සේ නම් කරන්න.

iii. සසුනේ චිරපැවැත්ම උදෙසා තෙවන ධර්ම සංගායනාව ඉවහල් වූ ආකාරය සංගායනාවේ ප්‍රතිඵල ඇසුරෙන් විමසන්න.

06. i. විපස්සනා භාවනාව හඳුන්වන වෙනත් නම් **දෙකක්** ලියා දක්වන්න.

ii. භාවනාවට පිවිසෙන තැනැත්තා විසින් ඉටුකර ගතයුතු පූර්ව අවශ්‍යතා **තුනක්** නම් කරන්න.

iii. බෞද්ධ භාවනාව වැඩීම තුළින් ශිෂ්‍ය ජීවිතයට ලබාගත හැකි ප්‍රයෝජන පැහැදිලි කරන්න.

07. පහත සඳහන් මාතෘකා අතුරින් **දෙකකට** කෙටි සටහන් ලියන්න.

i. සරණංකර සංඝරාජ නාහිමි

ii. කණිෂ්ක සංගායනාව

iii. සිව්බඹ විහරණ

iv. මහනුවර යුගයේ චිත්‍ර කලාව